# නිර්මාණ Nirmana

## ජනපති වීරයාණෙනි රට කළ එකලූ

තිස් වසරක් පුරා ලක්මව හෙලු කඳු ලූ
විසඳා ඇගේ ශෝකී හද සනසා ලූ
විස්මිත ජයෙන් අද මුළු ලෝකය හෙල් ලූ
ජනපති වීරයාණෙනි! රට කළ එක ලූ

දිවි දුන් නිසා සැමියන් රණබිමේ එදා
වැළපුණි දහස් ගණනක් බිරිඳන් සැමදා
බේරාගන්න මව්බිම දූ පුතුන් පුදා
මව්පියො සුසුම් හෙලුවා නිති සිරස බදා

මිනිසෙකු නිසා උමතුවූ ලේ පිපා සිත
සුවහස් දනන් රණබිම දිවි පුදා ඇත
එය වළකනු පිණිස දිව රෑ යොමා හිත
ඔබ කළ මෙහෙය අප හද තුළ ඇඳී ඇත

බටහිර රටවලින් ආ බාධක වලි නුත්
දෑ පෙම බින්දුවක්වත් නැති පිරිසගෙ නුත්
පැමිනුණ නොයෙක් බාධා හා අවලා දත්
ජයගත් ඔබට අද ලොව සෙත් පවන් සලත්

විරුබව නැණ ගුණය හදවත්වල පිරුණු
ඔබ වැනිම වූ සොහොයුරු පිරිසක් ලැබුණු
පින් මහිමය නිසා ලක්බිම තුළ තිබුණු
ගිනිදැල් නිවී සිසිලස අද ඇත දැනුණු

රුහුණෙම උපන් පින්බර දුටුගැමුණු රජුන්
යුදයට එළඹුණේ සමගයි පර සතුරන්
අද ඒ ත්‍රස්තයින් හා සිංහළ ද්‍රෝහින්
පැරදූ ඔබේ නම ලියවෙයි රන් අකුරින්

ඔබ හා සොහොයුරන් බිහිකර දුන් නාට
ගුණ නැණ පිරි උතුම් මව්පියො දෙන් නාට
වෙන කිසි පිනක් නොකළත් දෙව්ලොවේ සිට
සැහෙයි මෙ පින සගමොක් සුව ලැබී මට

මෙත් කරුණාව මුදිතා ගුණ හද පුරවා
රිජු ගති සරල හෙළගති ලොවටම පළවා
අද ජය කෙහෙළි නංවන ජනපති විරුවා
තෙරුවන් බෙලෙන් සියවස් කල් වැජ ඹේවා!

විශාමලත් විදුහල්පතිනි
♦ ප්‍රේමා අදිකාරි
Morden Surrey UK

## අප දේශයේ විරු දරුවන්

නොමැත යැව්වේ උණ්ඩයක් ඔබ
අහිංසකයන් මරා දැමුම ට
උතුම් මනුදම් නිසා බැඳුණේ
උරුමයත් රට දැයද රැකුම ට
තබා දිවි පරදුවට යුද පෙරමුණට
ඔබ පිවිසුණේ සැබැව ට
දරුණු නොදැමුණු කොටින්ගෙන්
දේශයේ වැසියන් මුදාගන්න ට

ඔබේ රුධිරය ඔබේ හදවත
නොමැත වෙනසක් මගෙම වන් නේ
රටේ නිදහස දැයේ උරුමය
ඔබේ දෙඅතින්මය රැකෙන් නේ
නැසී යන්නට නොදී මේ හැම
ඉදිරි පරපුර වෙත ගෙනෙන් නේ
වීර රණවිරු දූ පුතුන්මය
ජාතියේ නියමුවන් වන් නේ

ඔබේ අදිටන දිරිය නොඅඩුව
නැගෙන හිරු මෙන් දසත දිදු ලයි
කඩා බලකොටු බිඳැර රුදු බල
දැයේ උරුමය අපට රැක දෙයි
නගා ජයගොස පෙරමුණේ යන
සවිය අදිටන සදාතනි කයි
මතක්වෙන හැම වෙලේ ඔබ රුව
අපේ හදවත් තුළට කිමි දෙයි

♦ කරුණා බස්නායක
London NW6

## ආයුබෝ වේවා!

මව්බිම විසිරි නිදහස් අරුණැලි දහරා
නංවයි දනන් මුව මත හසරැළි වරුණා
සිංහ පැටව් නිජබිම පීවෙන් පුරවා
නංවනු සකි බලන් උද්දාමයක සොබා

මහ සයුරින් වට පෙරදිග මුතු ඇටයේ
පාවී දසත යයි නිවහල් සිලි සිලියේ
තුරු වැල් කුසුම් පුබුදා නර්තන පානා
සිහ ධජ ලක පුරා අභිමානෙන් ලෙළදේ

සනහා දනන් හදවත් සතුටින් පොබයා
දළුලා වැඩේ දහසක් නව ප්‍රාර්ථනා
සතුටද සැනසුමද ඉතිරී පැතිරෙත්වා!
අභිමානවත් දෙරණට ආයුබෝවේවා!

♦ එරංගා පෙරේරා
Netherlands



## මහා මහින්ද නායකයාණන්!

නුවර දළදා මාළිගාවට,
සිරිමහා බෝධියට පැන්නා
ගුවන් තොටුපළ, මහා බැංකුව,
සෙනග ගැවසෙන තැනක් දන්නා
බෝම්බය බැඳ මැරෙන්නට එන
කොටි ඇවිත් ඒ මැදට පැන්නා
ගෙවුණ තිස් වසරක්ම ලක්මව
කඳුළු සලමින් දුකින් උන්නා

උදේ ගෙදරින් පිටව යන අය
හවස ඒවිද කියා නොදනී
රටේ ජනනායක ප්‍රභූවරු
දිනෙන් දින මහ මහදි මැරුණී
පන්සලේ කෝවිලේ පාසැල
වෙළේ කුඹුරේ වුවත් මැරුණී
කොටින්ගේ දඩයමට අසුවන
විලාපය දස දෙසින් ඇසුණී

රටින් පලවා හරින්නට කොටි
ත්‍රස්තවාදය මුලින් සිඳ බිඳ
දමන උපදෙස් දිරිය ඉහළින්
ලැබුණි රණවිරුවන්ට නිසි ලෙද
ත්‍රිවිධ හමුදා පොලිසියේ නිය-
මුවන් දිව රෑ දෙකේ දුක් විඳ
සහමුලින් සුන් කළා කොටි රැළ
සිංහකොඩි ළෙල දේවි රට අද

ත්‍රස්තවාදය නසන අදහස
දැඩිව රුඳවූ තමන් හද තුළ
රජෙක් ලැබුණා සවිය එඩිතර
ගතිය මුළු ලෝකයට පළ කළ
මහ මිහිඳු රජතුමාණෙනි අප
රටේ ජනතාවගේ සිත් තුළ
තිබුණු දුක් කඳුලැලි නිවාලූ
ඔබතුමා දෙව් කෙනෙකි මිහි තල

මියෙනතුරු බයනැතුව ඉන්නට
රටක් නිවහල් ලැබුණී අප හට
පතමු ආසිරි අපේ සිරිලක
දිනේවයි මුළු ලොවේ හැම විට
ලක් පොළව සිප ජනපතිඳු තම
රටට පෑ ආදරය දුටු විට
සතුටු කඳුළක් නැගුණි නිසැකව
බලාහුන් දහසකගෙ දෑසට

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## රණවිරු උපහාර

යුතුකම වගකීම මුළු හදවතින් ගෙන
රට දැය සමය ජීවය ලෙස සිතා ගෙන
මා පිය අඹු දරුන් සෙවනින් මිදී ගෙන
ඔබ කරනා මෙහෙය යුද බිම අරා ගෙන

නින්දක් රසැති කෑමක් කල වෙලා වට
සුවයක් ගතට මිහිරක් ඇස් කන් වලට
නොම ගෙන මුළු දිවිය පුද දී රණ බිමට
ඔබ අවදිව සිටී රැකුමට අපගෙ රට

ජීවිත ආශාව මරබිය නැතුව සිතේ
දැඩි අදිටනින් වෙර වීරිය ඇතිව ගතේ
ඔබ කරනා මෙහෙය ඉපදුණු රටට පුතේ
අප ණය ගැතියි ඔබහට සැක නැතිය සිතේ

ඔබ මෙලොවට දුන්න ඒ ගරු දෙමා පියන්
සොහොයුරු සොයුරි අඹුදරුවන් හා ලේ නෑයන්
පැසසිය යුතුය ඔබ හට කර ගරු බුහුමන්
දිගු කල් දිනේවා ඔබ වැනි දූ දරුවන්

♦ මධුරි අබේවික්‍රම Harrow UK

## හමුදා පුතුන්ගේ පිහිටයි!

මහියංගනය කැළණිය නාග දීපෙද
මුතියංගනය සමනළ රැඳුණු සිරි පද
රජරට පුරා අභිමානය රැඳුණි තෙද
හමුදා පුතුන්ගේ පිහිටයි රටට අද

♦ රත්නාවලි කුමාරි දිසානායක
Hounslow Middx



## සැනසෙන් සිරිලක් මවුනි !

ගෙවීයයි තිස් වසක සාපයේ අඳුරු පට
මැකීයයි සිතියමෙන් ලේ වැකුණු බෙදුම් වැට
නැගී එයි නව ඉරක් පණදෙමින් සතර වට
සිදීයයි ලක්මවගෙ කඳුළු ගඟ මෙතැන් සිට

පොවා නව ජීවයක් ගෙන එමින් ප්‍රබෝධය
සිනා පිරි දොරින් දොර උපදමින් නවෝදය
එදා අනුරාපුරේ පැවති ශ්‍රී සුභූතිය
උදාවෙයි තුන් හෙළේ පුරා ඒ විභූතිය

අසිරිමත් දේශයට පර දෙසෙන් විත කළෙන්
දුටුගැමුණු මාගමින් පැමිණ රැකගත් ලෙසින්
ත්‍රිවිධ රත්නයෙ බෙලෙන් ජාතියේ පෙර පිනෙන්
උපන්නා මැදමුලන මිහිඳු මහ නර නිඳුන්

පුතණුවනි සොහොයුරන් දිවි පිදූ දේශයයි
දියණියනි සොයුරියන් උරතැබූ දේශයයි
වෙහෙරමාතා ගැමුණු ඔප දැමූ දේශයයි
රැකගන්න අද පටන් මේ ඔබේ දේශයයි

ලැබේවා සුව සෙවණ රුවන් වැලි සෑ වෙතින්
නිවේවා ගත වෙහෙස පරාක්‍රම සමු දුරෙන්
සැලේවා රන් සෙමර ශ්‍රී මහා බෝධි යෙන්
දිලේවා හෙළ දෙරණ නිලඹරේ හිරු ලෙසින්

♦ ශ්‍රියා කුමාරසිංහ
Dunedin,
New Zealand

## ලක් මවගෙන් විවරණ

සිටියා මට පුතෙකු පෙර දුටු ගැමුණු කියා
ඔබයි පුතේ යළි ඉපදුණු මිහිඳු කියා
ඔබ දෙදෙනාම සතුරන් ජයගත්ත නියා
ඉතිහාසයේ රන් අකුරින් ලියවී ගියා

ඇකයේ හොවා මා ඔබ දැඩි කෙරු වාට
මා ණයගැතියි මගෙ දුක් ගිනි නිවී වාට
දෙදණ නවා නුඹ මා සිප වඳින කොට
උණු කඳුළක් නැගුණි මාගේ නෙත් කොණට

ගැරහුම් වලට නොසැලී නුඹ සිටිය පුතේ
අවුරුදු තිහක් මා විඳි දුක් නිමයි පුතේ
මගේ හිතට සැනසුම ළං කෙරුව පුතේ
මතු බුදුවෙන්න විවරණ මගෙ මිහිඳු පුතේ

♦ කුමාරි විජේරත්න
Hounslow
Middx UK

## විරුව නුඹ නිසා !

උතුරයි දකුණයි නැගණහිරයි
එකම හීනයේ යා වීලා
වගුරයි සැනසුම් සුවේ මෙදා
උතුරු වසන්තය උදාවෙලා

ජීවිත පුද දී දුක් විඳලා
රුපු පරදා ජය දද නංවා
පෑ විකුමෙන් තුන් හෙළේ පුරා
යළි ඉපදුණ සේ දැනෙයි මෙදා

පින් බිම රන් වැටකින් බැඳුණා
දැය පිනවා ජයගොස නැගුණා
අවි දරනා රණබිම විරුවා
පෑ විකුමෙන් හෙළයම දිනුවා

♦ ධම්මි විජේසිංහ
Mississauga Canada

## විරු පුතුන් නිසා

සිඳිමින් සතුරු බල යළි මතු නොවන ලෙසා
ඔබ පෑ විකුම් අද ඇත මුළු ලොවම අසා
තිස් වසරක් හැඬූ ලක් මව සිත සනසා
අද ඇය සිනාසෙයි ඔබ විරු පුතුන් නිසා

♦ වජිර තුෂාර මුදලිගේ
North Wales UK

## රණවිරු යස ගොස

අද දින අප අතර
ගිරා සඳෙසෙහි කතු වර
සිටියේ නම් මෙ වර
මෙසේ පවසනු
ඇතිය කිවි කර

තෙවිකුම් විකුම් ඇති
අප රණවිරුන් එඩි ඇති
ලක්මව හට අයිති
සියළු දසටක්
වන්නි ජය ගති

මෙ ලක ජනපති හට
අවනත නොවූ පෙර සිට
පරබාකරන් හට
නොමඳ බලයෙන්
වැදී යුද යට

කළ යුදෙහි රිද වා
ඔහු පසින් ලුහු බඳ වා
ඔහුගෙ ඔද සිඳ වා
සියළු සතුරන්
ගනියි බඳ වා

මැති සෙනග සල සා
යාපා වන්නි නොල සා
ගෙන අදහස ලෙසා
තිබිය පස්වා
දහස් යස සා

සිය ගණනක් මෙසේ
රුදු රණ දිනා වෙසෙ සේ
දැක්වී යස රැසේ
පොරණ ලක්
රණවිරුන් විල සේ

♦ වෛද්‍ය උපාලි අබේසිරි
Middx UK

## පොරොන්දුවෙමි මා පුතුට

ගිනි අවිය ගෙන අතට
යනවිටක යුද බිමට
දැන ගතිමි පණිවුඩය
රන් කැටියෙකු
ලැබුණු වග

ආපසු හැරෙන්නට
නොහැකිය මගේ
රන්පුත
නිදහසේ දුව පනින්නට
මේ සිරිලක් පොළව
බේරා දෙන්නම්
මා පුතුට

♦ ප්‍රියන්ති අබේනායක
Paris France

## නිදහස් සමර

අඩසිය වසක සිට හිඳි හෙළදිවට ලොබා
රුපු බල එළාරගෙ සිඳ බිඳ දැමුව නොබා
රට දැය නගා බුදු සසුනෙහි විහිදු පබා
නරපති අනුරපුර යුගයෙහි ගැමුණු අබා

කළිඟු මාඝ ගොඩබැස කැටුවම මහ සෙන්
මහඟු පොලොන්නරු නගරය ගිනි තබ මින්
සැලසූ විපත්තිය දුරු කළ එක පැහැ රින්
විජයබාහු දඹදෙණි යුගයෙහි නිරි ඳුන්

රජයට පස මිතුරු වූ අරිය සක් විතී
නතුකොට තම අණට ඔද සිඳ දැමූ බලැතී
යාපා පටුන ජයගෙන පැමිණි සෙන් පතී
කෝට්ටේ යුගෙහි සපුකුමරු වික් මැතී

පෙන්විය ලොවට විරුකම් සිහළ ගරු තර
පෙන්විය එලෙස කොටි මැරකම් ද ගොර තර
ගෙනදුනි සියලු දනහට නිදහස පවර
ජනපති කොළඹ යුගයෙහි මිහිඳු එඩි තර

පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
යනුවෙන් කීහ පෙර අප හෙළෙහි පඩි වරු
ගරු කළ යුතුය රට රැකි පුතුනට මහරු

කොතරම් යුග ගණන් ගතවී ගියද පෙර
මෙරම් දරුණු යුගයක් නොවුණි මින් පෙර
ලද සම්පතින් සිත සතපා ගෙන මෙවර
මෙම රම් වසින් අරඹමු නිදහස් සමර

♦ සේපාලිකා ජයසිංහ
Middx UK

## සිරිලක දිනේවා !

තිස් වසරක් පුරා යුද්ධය පැවති කල
ජීවිත කොතෙක් වැනසුනිදෝ මෙ මිහි තල
එසියල් දැන් අතීතය වී මැකෙන කල
ලක්බිම පිපුණි සුවඳැති සාමයේ මල

අවසන් වුණේ පැවතුණු රුදුරු යුද්දය
නැවතුණි එතෙක් තිබු වෙඩි පිපිරි සද්දය
රණවිරු පුතුන් පෑ එඩි මතින් ලත් ජය
සහතික කෙරේ නැති බව යළිත් යුද්දය

දහසක් මැණිවරු වැළපුණු කඳුළු සලා
ඒ දුක මේ ජයෙන් යනු ඇත තුනී වෙලා
වැළලුණු රටේ සම්පත් යළි ගොඩ දමලා
දෙස සරු කරමු දැන් අපි හැම එකතු වෙලා

දෑ හිතකාමී නයුවෙකු සිටිනා රටට
නෙමැතේ විඳින්නට කිසි දින දුක ගැහැට
සරු සාරවී සුර ලොව ආ ලෙස බිමට
සිරිලක දිනේවා! මිණි කැටයක් ලෙසට

♦ නිරංජලා මනෝහාරි
Nicosia Cyprus